හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණුකිරීමේ ආයතනය

# ගොවිකටයුතු පුවත් හසුන

වෙළුම 48 2024 දෙවන කලාපය ISSN: 1994-040x



හම්බන්තොට
දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින්
ගොවි සංවිධාන ශක්තිමත්
කිරීමේ පුහුණු වැඩසටහන්
මාලාවක්
පිටුව 05




## HARTI පර්යේෂණ අධ්‍යයනයන්හි ප්‍රතිඵල ආශ්‍රයෙන් ගොවිජන ක්ෂේත්‍රයෙහි පුළුල් කතිකාවක් නිර්මාණය කිරීමට හැකි වුණා

**කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර**



**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ වාර්ෂික පර්යේෂණ මණ්ඩපය කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අප්‍රියෙල් මස 03 වන දින මහින්ද සිල්වා ශ්‍රවණාගාරයේ දී පැවැත්වුණි.**

2023 වර්ෂයට අදාළව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද කාලීනව වැදගත් පර්යේෂණ අධ්‍යයනයන්හි සොයාගැනීම් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සෙසු පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සහ එම පර්යේෂණ, පුහුණු සහ තොරතුරු සන්නිවේදන කටයුතු පිළිබඳව විවිධ පාර්ශ්වයන්ගෙන් අදහස් හා යෝජනා ලබාගැනීම මෙම වැඩසටහනෙහි ප්‍රධානතම අරමුණ විය. 02 වැනි පිටුවට



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ
**ආචාර්ය ජී.ජී. බන්දුල මහතා**



ලෝක ආහාර වැඩසටහනෙහි නේවාසික අධ්‍යක්ෂ
**අබ්දුර්රහිම් සිද්දික් මහතා**





# ජාතික අලුත් සහල් මංගල්‍යය අනුරාධපුර ජයශ්‍රී මහා බෝ සමිඳුන් අභියස දී

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යංශය සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කළ 57 වන ජාතික අලුත් සහල් මංගල්‍යය අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස දී අප්‍රේල් 06 වන දින අති උත්කර්ෂවත් අන්දමින් පවත්වනු ලැබිය.

57 වන අලුත් සහල් මංගල්‍ය ජාතික උත්සවය වෙනුවෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව ප්‍රකාශයට පත් කළ 57 වන අලුත් සහල් මංගල්‍යය විශේෂ සමරු කලාපය එළි දැක්වීමද එම අවස්ථාවේ දී සිදු විය. එහිදී කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා සහ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල් ඒ.එච්.එම්.එල් අබේරත්න මහතා විසින් විශේෂ සමරු කලාපයේ මුල් පිටපත ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත පිරිනැමීම සිදුකළ ආකාරය ඡායාරූපයේ දැක්වේ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී. බන්දුල මහතා ද එම අවස්ථාවට සහභාගී විය.

01 පිටුවෙන්...

කුකුළු නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිත ගැටලු සහ ප්‍රතිචාර, දේශීය කෘෂිකාර්මික අංශයේ ගොවීන්ගේ මුල්‍ය සාක්ෂරතාවය, වියළි කලාපයේ කිරි නිෂ්පාදනයේ තාක්ෂණික කාර්යක්ෂමතාවයට බලපාන සාධක, ශ්‍රී ලංකාවේ සැකසූ පළතුරු සහ එළවළු කර්මාන්තය, ශ්‍රී ලංකාවේ දේශගුණ සුහුරු කෘෂිකර්මාන්තයේ සාර්ථකත්වයන් යන පර්යේෂණ පහක සොයා ගැනීම් හා නිර්දේශ මෙදින එළි දක්වනු ලැබීය.

එම අවස්ථාවට එක්වෙමින් අමාත්‍යවරයා සඳහන් කළේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ අධ්‍යයනයන්හි ප්‍රතිඵල ආශ්‍රයෙන් ගොවිජන ක්ෂේත්‍රයෙහි පුළුල් කතිකාවක් නිර්මාණය කිරීමට හැකි වී ඇති බවයි. විශේෂයෙන්ම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් වන සතුන්ගෙන් වන වගා හානි පිළිබඳව සිදු කළ පර්යේෂණය හේතුවෙන් පුළුල් කතිකාවක් නිර්මාණය වී ඇති බව අමාත්‍යතුමා මෙහිදී සඳහන් කළේය.

කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම් සහ අතිරේක ලේකම්වරුන්, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන ප්‍රධානින්, කෘෂිකර්ම පීඨාධිපතිවරුන් හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්, පුද්ගලික අංශයේ ව්‍යවසායකයින්, ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරුන් ඇතුළු විවිධ පාර්ශව නියෝජනය කරමින් විශාල පිරිසක් මෙම විද්වත් සභාව සඳහා තම ක්‍රියාකාරී සහභාගිත්වය ලබාදුන්හ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අලෙවි තොරතුරු පද්ධතිය වෙබ් මෘදුකාංගයක් හරහා ඩිජිටල් පද්ධතියකට ඇතුළත් කිරීමද මෙම අවස්ථාවේ කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මහතාගේ අතින් සිදු විය.

අලෙවි තොරතුරු පද්ධතිය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සහ තාක්ෂණික අනුග්‍රහය ලබා දෙන ලද්දේ ලෝක ආහාර වැඩසටහන විසිනි. ලෝක ආහාර වැඩසටහනෙහි නේවාසික අධ්‍යක්ෂ අබ්දුර්රහිම් සිද්දික් මහතා ද වෙබ් මෘදුකාංගය දියත් කිරීමේ අවස්ථාවට අමාත්‍යතුමන් සමඟින් සම්බන්ධ විය.

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ජානක ධර්මකීර්ති මහතා, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ජී.ජී. බන්දුල මහතා, අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා ඇතුළු නිලධාරීහු පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.



# Govimina.com Kamanalam.com ගොවිජනගත කෙරේ

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමා විසින් Govimina.com වෙබ් අඩවිය ගොවිජනගත කරන අයුරු. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය මොහාන් පී. ද සිල්වා මහතා, ආයතනයේ අධ්‍යක්ෂතුමා සහ , DevPro Guarantee Limited විධායක අධ්‍යක්ෂ තිලක් කරුණාරත්න මහතා ඡායාරූපයේ සිටී.

**කෘ**ෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලික සමාගම්වලට සිය ප්‍රවෘත්ති, දැනුම, මතවාද, තාක්ෂණය ඇතුළු සියලු ආකාරයේ අත්‍යවශ්‍ය තොරතුරු ගොවිජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා මාධ්‍ය වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණින් සැලසුම් කළ Govimina.com සහ Kamanalam.com වෙබ් අඩවි ද්විත්වය ගොවිජනගත කිරීමේ උත්සවය ජුනි 27 දින කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ නාරායනසාමී ශාලාවේ දී පැවැත්වුණි.

මෙම වෙබ් අඩවි ද්විත්වය නිර්මාණය කිරීම සඳහා පූර්ණ මූල්‍ය අනුග්‍රාහකත්වය දරා ඇත්තේ DevPro Guarantee Limited ය. මෙදින ජනගත කළ මෙම වෙබ් අඩවි දෙක වන Govimina.com ඔස්සේ සිංහල භාෂාවෙනුත් Kamanalam.com ඔස්සේ දමිළ භාෂාවෙනුත් නවතම කෘෂිකාර්මික තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඇත.

උත්සව සභාව ඇමතූ කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය  මහින්ද අමරවීර මැතිතුමා සඳහන් කළේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන සතු තොරතුරු ඒකාබද්ධ වේදිකාවකට ගොනු කර බෙදා හැරීමේ අවශ්‍යතාව ඇති බවයි. එසේම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, DevPro ආයතනය සමග අත්වැල් බැද ගනිමින් ගොවීන් වෙත යාවත්කාලීන තොරතුරු ලබා දීම සඳහා ගන්නා වූ මෙම වෑයම එතුමාගේ ඇගයීමට ලක් විය.

මෙම අවස්ථාවට කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ජානක ධර්මකීර්ති මැතිතුමා, ජනාධිපති ලේකම් කාර්යාලයේ ආහාර සුරක්ෂිතතාව සහ යටිතල පහසුකම් අංශයේ අධ්‍යක්ෂ පී.එම්.එස් ජයතිලක මහතා, ඕස්ට්‍රේලියානු මහකොමසාරිස් කාර්යාලයේ සංවර්ධන හවුල්කාරීත්වය පිළිබඳ පළමු ලේකම්තුමිය, DevPro Guarantee Limited විධායක අධ්‍යක්ෂ තිලක් කරුණාරත්න මහතා, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී. බන්දුල මහතා ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.




# ගෘහ ඒකකයන් හි ආහාර සුරක්ෂිතතාවය පිළිබද කාන්තා සංවිධාන නායිකාවන් සහ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් මාලාව

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන 'ගෘහ ඒකකයන් හි ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ කාන්තා සංවිධාන නායිකාවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් මාලාවේ' තුන්වෙනි අදියර මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් මැයි 13 වෙනි දින ආරම්භ කරන ලදී.

මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලෙයිපත්තු උතුර, කෝරලෙයිපත්තු දකුණ, මන්මුනෙයි උතුර, මන්මුනෙයි බටහිර සහ දකුණ එරාවුර්පත්තු, කාත්තන්කුඩි, පෝරතිව්පත්තු යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 10ක් ඉලක්ක කරගනිමින් පුහුණු වැඩසටහන් 10ක් මැයි මස 17 වන දින දක්වා පවත්වන ලදී.

මෙම පුහුණු වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශයේ පෝෂ්‍ය පර්යේෂණ නිලධාරිනි සුසිලා ලූර්දු මහත්මිය විසින් සිදු කළ අතර පෝෂ්‍ය පර්යේෂණ නිලධාරි/අංශ ප්‍රධාන ආචාර්ය චතුර ජයම්පති, අධි පර්යේෂක එස්.එම්.ඒ. සමරකෝන් සහ පෝෂ්‍ය පර්යේෂණ නිලධාරී චින්තක ජයසූරිය යන මහත්වරු විසින් සම සම්බන්ධීකරණය සහ ආයතනික සම්පත් දායකත්වය ලබා දෙන ලදී. මීට අමතරව නැගෙනහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මඩකලපුව දිස්ත්‍රික් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන මධ්‍යස්ථානවලින් බාහිර සම්පත් දායකත්වය සපයන ලදී.

පුහුණු වැඩසටහනේ තුන්වෙනි අදියර යටතේ දැනුවත් වීම් ලද කාන්තා සංවිධාන නායිකාවන් සහ සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 440 කි.









# හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ පුහුණු වැඩසටහන් මාලාවක්

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 10ක ප්‍රජා සංවර්ධනය උදෙසා ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ පුහුණු වැඩසටහන මීගහජදුර සහ අගුණකොළපැලැස්ස ගොවිජන සේවා මධ්‍යස්ථාන ද්විත්වය මුල් කරගනිමින් ආරම්භ විය. 2023 ජූනි 24 සිට 28 දක්වා පැවති පුහුණු වැඩසටහන් මාලාවේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වූ අනෙකුත් ගොවිජන සේවා බල ප්‍රදේශයන් වූයේ මීගස්ආර, වලස්මුල්ල, වීරකැටිය, උඩයාල, වීරවිල, අම්බලන්තොට, යෝධකංඩිය සහ ලුණම යන බල ප්‍රදේශයන්ය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යාපන හා පුහුණු අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය චතුර ජයම්පති මහතාගේ සම්බන්ධීකරණයෙන් පැවැත්වූ පුහුණු වැඩසටහනෙහි සම සම්බන්ධීකරණ කටයුතු සහ සම්පත් දායකත්වය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන චින්තක ජයසූරිය සහ සුසිලා ලූර්දු යන මහත්ම මහත්මීන් විසින් සිදු කරන ලදී.



ප්‍රජා සංවර්ධනය සඳහා සංවිධාන, ගොවි සංවිධාන නීතිය සහ ගොවි සංවිධාන ගිණුම් කටයුතු සහ පොත්පත් නඩත්තුව යන තේමාවන් මූලික කරගනිමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු වූ අතර බාහිර සම්පත්දායකයින් ලෙස හම්බන්තොට දිස්ත්‍රික් ගොවිජන කොමසාරිස් කාර්යාලයේ මුලස්ථාන ගොවිජන ප්‍රාදේශීය නිලධාරි රසික චමින්ද, එස්. එච්. වන්නිආරච්චි සහ සහකාර කොමසිරිස් එන්. කේ. චන්ද්‍රවංශ මහතා සම්බන්ධ විය.

මෙම පුහුණු වැඩසටහනෙහි පුහුණු ප්‍රතිලාභීන් වූයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සහ ගොවි සංවිධාන නායකයින් වන අතර සමස්ත පුහුණු වැඩසටහන මගින් පුහුණු ප්‍රතිලාභීන් 484 දෙනෙකු පුහුණු කිරීම සිදු කරන ලදී .

ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී. බන්දුල මහතා ද පුහුණු වැඩසටහනෙහි ආරම්භක අවස්ථාවට සම්බන්ධ වූ අතර පුහුණු වැඩසටහනෙහි සාර්ථකත්වයට ද විශාල මගපෙන්වීමක් සිදු කළේය.





# ගැඩවිල් කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ ආදර්ශන වැඩසටහනක් මොරටුවේ දී

කුඩා පරිමාණ /ගෙවතු වගාව සඳහා වර්මි කොම්පෝස්ට් නිෂ්පාදනය හඳුන්වා දීම ඉලක්ක කරගත් මෙ වැඩසටහන එම ආයතනයේ අධි පර්යේෂක රේනුකා වීරක්කොඩි මහත්මිය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ දායකත්වයෙන් සිදුකරන ගැඩවිල් කොම්පෝස්ට් (වර්මි කොම්පෝස්ට්) නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ ආදර්ශන වැඩසටහනක් 2024 මැයි මස 17 වන දින මොරටුව දුම්රිය ස්ථානය අසලදී පවත්වන ලදී.

ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන Vermicompost Whatsapp සාමූහිකයේ සාමාජික උදිත් හේරත් මහතාගේ නිවසේදී එම ආදර්ශනය පැවත්වූ අතර එම සාමූහිකයේ සාමාජිකයන් වැඩසටහනට සහභාගි වූහ.

## පුනර්ජනනීය ගොවිතැන ප්‍රවර්ධනය කිරීම උදෙසා පුහුණු වැඩසටහනක්

පුනර්ජනනීය ගොවිතැන ප්‍රවර්ධනය කිරීම උදෙසා පර්යේෂණ හා සන්නිවේදන මෙහෙවරක නියැළෙන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය (HARTI) 2024 ජුනි මස 16වන දින තවත් ඉදිරි පියවරක් තබමින්, දොම්පේ, උඩුමාපිටිගම FARMWAY ගොවි කේන්ද්‍රයේ දී අධ්‍යාපනික හා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

HARTI ආයතනයේ අධි පර්යේෂක රේණුකා වීරක්කොඩි මහත්මිය විසින් සම්බන්ධීකරණය හා මෙහෙයවන ලද මෙම වැඩසටහනට දොම්පෙ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරිනී තරංගා දිල්හානි රාජපක්ෂ මහත්මිය ද සහභාගි වූවාය.

HARTI ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන Vermicompost WhatsApp සාමූහිකයේ සාමාජිකයන් 28 දෙනෙකු සහභාගි වූ මෙම වැඩසටහනට පුනර්ජනනීය ගොවිතැන් ශිල්පීය ක්‍රම කීපයක් ඇතුළත් විය.

FARMWAY අධිපති රංජිත් රණතුංග මහතා විසින් ගැඩවිල් කොම්පෝස්ට්, ජීව අඟුරු, සහ කර දහයියා නිෂ්පාදනය සඳහා සියලු කටයුතු සංවිධානය කළ අතර එතුමා ඉදිරිපත් කළ සවිස්තරාත්මක ප්‍රායෝගික ක්‍රියාකාරකම් පුහුණුලාභීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමට බෙහෙවින් ඉවහල් විය. ගම්පහ දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ දුලාංජලී චන්ද්‍රසේකර මහත්මියගේ මඟ පෙන්වීම මත දොම්පෙ මූලස්ථාන කෘෂිකර්ම උපදේශක චතුර රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ ප්‍රායෝගික බිඟු පාලන සැසිය පුහුණුලාභීන්ට නවමු අත්දැකීමක් එකතු කළ සුවිශේෂී අංගයක් විය.

දිවයිනේ දුර බැහැර ප්‍රදේශවලින් පවා වැඩසටහනට සහභාගී වූ පුහුණුලාභීන්ට කිසිදු අය කිරීමකින් තොරව පැවැත්වූ මෙම වැඩසටහනට ආහාර පාන, උපකරණ, අමුද්‍රව්‍ය හා ප්‍රවාහන පහසුකම් සැපයුවේ FARMWAY අධිපති රංජිත් රණතුංග මහතා ඇතුළු පවුලේ සාමාජිකයින් විසිනි.



# නැකතට පැළයක්

උදා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් පැළ සිටුවීමේ ජාතික නැකත අප්‍රේල් මස මස 18 වන දින පෙරවරු 10.16ට යෙදී තිබුණි.

එය සංකේතවත් කරමින් පැළ සිටුවීමේ වැඩසටහනක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතන පරිශ්‍රයේ දී පැවැත්වුණි.

පැළ රෝපණය කිරීම වෙනුවෙන් වූ කෙටි උත්සවය ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර එම අවස්ථාවට ලේඛකාධිකාරී බී.ආර්.සී. බණ්ඩාර මහතා, ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී දුමින්ද ප්‍රියදර්ශන මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය සහභාගී වූහ.





## උපදේශකත්වය

ආචාර්ය ජී.ජී. බන්දුල

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

## අධීක්ෂණය

ශාන්ත හේවගේ

අංශ ප්‍රධාන
තොරතුරු හා සන්නිවේදන අංශය

## සම්පාදනය

වසන්ති රාජපක්ෂ

ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

*ගොවිකටයුතු පුවත්හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදා හැරීම*


හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

0112 696981 - 0112 692423

www.harti.gov.lk
https://www.facebook.com/hartilk
https://www.instagram.com/harti_lk/
http://twitter.com/harti_lk


හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා පුහුණු වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ හා පුහුණු තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.




